❖ ඡේදය හොඳින් කිහිප වරක් කියවන්න

සුනිල්ගේ පොඩි වුණු සුදු කමීස අතෙහි මඩ පැල්ලමක් තිබුණේය.නිල් කලිසමත් කිලිටි ය.එදා සිකුරාදා නිසා ඒකට නම් කමක් නැත.සඳුදාට තවත් අලුත් ඇඳුමක් අඳින හෙයිනි.කළු සපත්තු ජෝඩුව දූවිල්ලෙන් වැසී තිබුණේ ය.ඒ දුටු සුනිල් තනි කකුලින් සිට ගෙන අළු පාට මේස් වලින් සපත්තු පිසදා ගත්තේ ය.වමින් පීරා තිබුණු බොකුටු හිසකෙස් තරමක් අවුල් වී තිබිණි.පළල් නළලෙහි දහඩිය මුසු දූවිලි රැඳී තිබුණේ ය. **(අඹ යහළුවෝ-ටී.බී.ඉලංගරත්න)**

ඡේදය ඇසුරින් වාචික පිළිතුරු ලබා ගන්න.

1. **සුනිල්ගේ සුදු කමීස අතෙහි ගෑවී තිබුණේ මොනවාද?**
2. **ඔහුගේ කලිසම කුමන පාට ද?**
3. **දූවිල්ලෙන් වැසී තිබුණේ කුමක් ද?**
4. **මේස්වල පාට කුමක්ද?**

❖ **පහත වාක්‍ය(√)හරි ලකුණ ද වැරදි නම්(×)වැරදි ලකුණ ද යොදන්න.**

1. **සුනිල් සඳුදාට අලුත් අඳියි** ( )
2. **සුනිල් සඳුදාට පාට ඇඳුම් අඳියි** ( )
3. **කළු සපත්තු ජෝඩුවේ දූහුවිල්ල තිබුණි** ( )
4. **සුදු සපත්තු ජෝඩුවේ දූහුවිල්ල තිබුණි** ( )
5. **සුනිල්ගේ කමීස අතෙහි කහට පැල්ලමක් තිබුණි** ( )
6. **සුනිල්ගේ කමීස අතෙහි මඩ පැල්ලමක් තිබුණි** ( )

❖ **වරහන් තුළින් නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

1. **සුනිල්ගේ සුදු කමීස අතෙහි (මඩ පැල්ලමක්/කහට පැල්ලමක්)තිබුණි.**
2. **සුනිල්ගේ (සුදු කලිසම/නිල් කලිසම)කිලිටි ය.**
3. **සම්(සපත්තු/සෙරෙප්පු)ජෝඩුව දූහුවිල්ලෙන් වැසී තිබුණේ ය.**
4. **(සිකුරාදාට/සඳුදාට)සුනිල් අලුත් ඇඳුමක් අඳියි.**
5. **සුනිල් (අළු පාට/සුදු පාට)මේස් වලින් සපත්තු පිසදා ගත්තේ ය.**

❖ **පහත වචන අසා ලියන්න.**

අලුත්,ඇඳුම්,කිලිටි,දූහුවිල්ල,සඳුදා,කළු සපත්තු,ජෝඩුව,අළු පාට,බොකටු,නළල